

# සංචාරක කුරුල්ලන්ට නිවහන සලසන බූන්දල කුරුළු පාරාදීසය

යූ.පී.එස්. පතිරණ

**උත්තර අර්ධ ගෝලයේ ශීත ඍතුව ආරම්භ වීමත් සමග ශ්‍රී ලංකාවේ ද සංචාරක සමය** (Tourist Season) **ආරම්භ වේ.**

විශේෂයෙන් වර්ෂයේ ඔක්තෝබර් සිට අප්‍රේල් දක්වා වූ කාල සීමාව තුළ තම රටවල පවතින අධික ශීත දේශගුණයෙන් මිදී ශ්‍රී ලංකාව වැනි ඝර්ම කලාපයේ රටක හිරුගේ උණුසුම ලබමින් තම විවේකය ගත කිරීමට යුරෝපියයන් බොහෝ දෙනෙක් මෙම කාලය යොදා ගනිති.

එලෙස ම උත්තර අර්ධගෝලයේ වෙසෙන කුරුල්ලන්ගෙන් බොහොමයක් ද ශීත ඍතුවේ තද ශීතල දේශගුණයෙන් මිදීම සඳහා උත්තර අර්ධගෝලයේ සිට හැකි තරම් දකුණට වී හිරුගේ උණුසුම ලබා ශීත ඍතුව ගෙවෙන තෙක් ගත කිරීම සඳහා සංචරණය කරති.

යුරෝපයේ හා ඈත සයිබීරියාවේ සිට ගොඩබිම් ඔස්සේ මෙලෙස පියාසර කරනු ලබන සංචාරක කුරුල්ලන්ට එම කාලය තුළ සංචාරක නිවහන් සපයන එක් වැදගත් සංචාරක ආකර්ෂණයක් වනුයේ ශ්‍රී ලංකාවේ බූන්දල කුරුලු පාරාදිසය යි.

දකුණු වෙරළබඩ හම්බන්තොට හා කිරිඳි ඔය අතර පිහිටි බූන්දල ජාතික වනෝද්‍යානය කුරුලු අභය භූමියක් වශයෙන් වඩාත් ප්‍රකට ය. කොළඹ සිට කි.මී. 246 ක දුරින් පිහිටා ඇති බූන්දල කුරුලු පාරාදීසයට කොළඹ - කතරගම ප්‍රධාන මාර්ගයේ හම්බන්තොට නගරයට උතුරු දෙසින් වැලිගත්ත බූන්දල මාර්ගයන් හැරී වැලිගත්ත හන්දියේ සිට කි.මී. 5 ක දුර ගෙවා ළඟා විය හැකි ය.


රම්සා තෙත් බිමක් වශයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රථමයෙන් ම ජාත්‍යන්තර පිළිගැනීමට ලක්ව ඇත්තේ ද බූන්දල ජාතික වනෝද්‍යනය යි.

දිවයිනේ ජනවාර්ගික අර්බුදය ආරම්භ වීමට පෙර කුරුලු පාරාදීසයක් වශයෙන් සංචාරකයන් අතර ජනප්‍රිය වී තිබූ කුමන අභය භූමිය ජාතිවාදි කල කෝලහාල ඇතිවීමත් සමගම වැසීයාම නිසා බූන්දල



ජාතික වනෝද්‍යානය ශ්‍රී ලංකාවේ ප්‍රධාන කුරුලු පාරාදීසය බවට සංචාරකයන් අතර ප්‍රචලිත වීම නිරන්තරයෙන් සිදු විය.

හෙක්ටයාර් 6216 ක නැතහොත් වර්ග කි.මී. 2 ක පමණ භූමි ප්‍රදේශයකින් වසා පැතිරුණු බූන්දල ජාතික වනෝද්‍යානය වඩාත් ප්‍රකට වී ඇත්තේ විශාල වශයෙන් සංක්‍රමණික කුරුල්ලන් ඇදී එන කුරුලු අභය භූමියක් ලෙසිනි. බූන්දල වනෝද්‍යානය විශේෂයෙන් උත්තර අර්ධ ගෝලයේ ශීත ඍතුව ආරම්භ වීමත් සමගම මෙහි ඇදී එන සංචාරක කුරුල්ලන්ට වර්ෂයේ අගෝස්තු සිට අප්‍රේල් දක්වා කාල සීමාවක් තුළ තාවකාලිකව නවාතැන් සපයන කුරුලු නිවහනක් වී තිබේ. කලපු, උදම්මෝය , මඩ , ගොහොරු හා ලේවායන් සහිත බූන්දල ජාතික වනෝද්‍යානය ඈත සයිබීරියාව සහ නැගෙනහිර යුරෝපයේ සිට ඇදී එන සංචාරක කුරුල්ලන්ට උණුසුම ලබාදීමටත්, බිත්තර දැමීමටත් යෝග්‍ය ක්ෂේම භූමියක් වී තිබේ. උත්තර අර්ධ ගෝලයේ ශීත ඍතුව ආරම්භ වීමත් සමග සයිබීරියාවේ හා යුරෝපයේ සිට ශ්‍රී ලංකාව තෙක් සිදුවන පක්ෂි සංක්‍රමණ මාර්ගයේ අවසාන නැවතුම්පොළ ශ්‍රී ලංකාව බවට පත් වීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ ශ්‍රී ලංකාවට ඔබ්බෙන් දක්ෂිණ ධ්‍රැවය තෙක් වෙනත් ළඟපාත ගොඩබිමක් නොමැති වීමයි. මේ නිසා උතුරු අර්ධ ගෝලයේ සිට ශීත ඍතුවේ පවතින දැඩි සීතලෙන් මිදීම සඳහා සෑම වසරකම අගෝස්තු මාසයේ තම ගම් රටවල් වලින් පිටව යන කුරුල්ලන් විසින් පාවිච්චි කරනු ලබන සුපුරුදු "ඉන්දු - ආසියාතු ගුවන් පථය" ඔස්සේ සංක්‍රමණ මාර්ග දෙකකින් දකුණු ඉන්දියාව හරහා ශ්‍රී ලංකාවේ උතු-



බූන්දල කුරුලු පාරාදීසය තුළ දැනට හඳුනාගෙන ඇති කුරුලු විශේෂ සංඛ්‍යාව 149 ක් පමණ වේ. බූන්දලට ඇදී එන විදේශීය සංක්‍රමණික කුරුලු විශේෂ සංඛ්‍යාව 45 ක් වශයෙන් ද වාර්තා වී තිබේ. බූන්දල ජාතික වනෝද්‍යානයේ නේවාසික කුරුලු විශේෂ අතරට කළු මැටි කොකා, පුංචි සුදු කොකා පොඩි කොකා, කරවැල් කොකා, රෑ කොකා, සුදු දෑතුඩු කොකා, කහමැටි කොකා, පාදිලි කොකා, හංසකාවා, දාර දියකාවා, පුංචි දියකාවා, ගෙඹි සේරා, බළල් සේරා, දෑතුඩුවා, දම් කිතලා, හැඳි ආලවාවා, ඔටුමානා සහ කොරවක්කා ද ඇතුළත් වේ.

රුකරයෙන් ශ්‍රී ලංකා ගුවන් පථයට පිවිසෙන සංචාරක කුරුල්ලෝ දෙපැත්තකට බෙදී ශ්‍රී ලංකාවේ වයඹ දෙසින් මන්නාරම , පුත්තලම, බූන්දල් කලපුව, හරහා මුතුරාජවෙල තෙත්බිම තෙක් ද, ශ්‍රී ලංකාවේ ඊසාන දෙසින් යාපනය, චුන්ඩිකුඩි, කෝකිලායි කලපුව , ආරුගම්බොක්ක, කුමන කලපුව ඔස්සේ යාල, බූන්දල, කලමිටිය තෙක් ද ඇදී එති. උතුරු අර්ධ ගෝලයේ ශීත ඍතුව අවසන් වෙනවාත් සමගම වසරේ අප්‍රේල් මාසයේ මැද වනවිට මෙම සංචාරක කුරුල්ලෝ නැවත ආපසු මව්බිම කරා පෙරළා යති. වර්ෂයේ අගෝස්තු සිට අප්‍රේල් දක්වා එක් කාල පරාසයක් තුළ එබඳු සංචාරක කුරුල්ලන් විසි දහසකට අධික ප්‍රමාණයක් බූන්දල ජාතික වනෝද්‍යානය තුළ රැඳී සිටිනු නිරීක්ෂණය කළ හැකි ය. ඉන් සියක්කාරයා (Phoeni coperus Ruber) දෙදහසකට අධික සංඛ්‍යාවක් එක් වරකදී දැක ගත හැකි අතර,විරල ගණයේ කුරුලු විශේෂයක් ලෙස සැලකෙන අලි කොකා ද (Ephippiorhyachus Aslaticus ) නිරීක්ෂණය කළ හැකි ය.

බූන්දල කුරුලු පාරාදීසය තුළ දැනට හඳුනාගෙන ඇති කුරුලු විශේෂ සංඛ්‍යාව 149 ක් පමණ වේ. බූන්දලට ඇදී එන විදේශීය සංක්‍රමණික කුරුලු විශේෂ සංඛ්‍යාව 45 ක් වශයෙන් ද වාර්තා වී තිබේ.

බූන්දල ජාතික වනෝද්‍යානයේ නේවාසික කුරුලු විශේෂ අතරට කළු මැටි කොකා, පුංචි සුදු කොකා පොඩි කොකා, කරවැල් කොකා, රෑ කොකා, සුදු දෑතුඩු කොකා, කහමැටි කොකා, පාදිලි කොකා, හංසකාවා, දර දියකාවා, පුංචි දියකාවා, ගෙඹි සේරා, බළල් සේරා, දෑතුඩුවා, දම් කිතලා, හැඳි ආලවාවා, ඔටුමානා සහ කොරවක්කා ද ඇතුළත් වේ. බූන්දලට ඇදී එන සංචාරක කුරුලු විශේෂ අතරට රතවටුවා, තුඩ පළල් සිලිවටුවා, යුරෝපීය සිලිවටුවා, දෑකැති සිලිවටුවා, වගුරු සිලිවටුවා, ටෙරෙක් සිලිවටුවා, වන සිලිවටුවා, කොළ සිලිවටුවා, පුංචි වටුවා, ටෙමින්ක්ගේ පුංචි මාල වටුවා, කැස්වටුවා, උල්පෙඳ කැස්වටුවා, සුදු වටුවා, ලෙව්චිච සිලිවටුවා, මහ වටුවා, හිස දුඹුරු මුහුදු කපුටා, කැස්පියානු ඔලෙයියා, අළු ඔලෙයියා, කුඩා ඔලෙයියා, මහ ඔලෙයියා, මාල ඔලෙයියා, පුංචි මාල ඔලෙයියා, කැට පෙරලන ඔලෙයියා, යුරෝපීය මල් සේරුවා, තිබ්බත මුහුදු ලිහිණියා, කැස්පියානු මුහුදු ලිහිණියා, තුඩ ලොකු මුහුදු ලිහිණියා, පුංචි මුහුදු ලිහිණියා, රෝස මුහුදු ලිහිණියා, රැවුල් මුහුදු ලිහිණියා,, මහ කොණ්ඩ මුහුදු ලිහිණියා, ඇව පෙන්නා, සියක්කාරයා, කලපු කිරලා, තුඩ ලොකු වල් තාරාවා සහ ගාගනි වල්තාරාවා ද ඇතුළත් වේ.

බූන්දල ජාතික වනෝද්‍යානය කුරුල්ලන්ට පමණක් නොව වෙනත් සත්ව විශේෂ රැසකට ද නිවහන් සලසා දී තිබේ. සාමාන්‍යයෙන් 25 සිට 30 දක්වා වූ ජනගහනයකින් සමන්විත මෙහි අලින්ගේ සංඛ්‍යාව වියළි කාල වලදී 50 සිට 60 දක්වා ඉහළ යනු දැකිය හැකි ය. වනෝද්‍යානය තුළ දැක බලා ගත හැකි ක්ෂීරපායීන් අතරට දිවියා, වළහා, උණ හපුළුවා, දඬු ලේනා, හාවා, වල් බළලා, කොළ දිවියා හා උරුලෑවා ද ඇතුළත් වේ. විශේෂයෙන් සෑම වසරක ම පාහේ ඔක්තොබර් සිට ජනවාරි මාසය දක්වා බිත්තර දැමීමට බූන්දල වෙරළට ඇදී එන කැස්බෑ විශේෂ 5 ක් ද වේ. වඳවීයාමේ තර්ජනයට ලක් වී ඇති මෙම කැස්බෑ විශේෂ වනුයේ කොළ කැස්බෑවා (Cheloniamydas) පොතු කැස්බෑවා (Eretmochelys Imbricata) ඔළුගෙඩි කැස්බෑවා(caretta caretta) මඩ කැස්බෑවා(lepidochelys olivacca ) හා දර කැස්බෑවා(dermochelys divacca )ය. කැස්බෑවුන් හැරුණුවිට බූන්දල කලපුව ආශ්‍රිතව දැක ගත හැකි හැළ කිඹුලා හා ගැට කිඹුලා ද ශ්‍රී ලංකාවට ආවේණික මැඩි විශේෂයක් ද (frog – bufo athukoralei)වේ. මීට අමතරව විශාල වශයෙන් මත්ස්‍ය හා ඉස්සන් විශේෂ කිහිපයක් ද උදා.(grey mullet, tiger prawns) බූන්දල කලපුව ආශ්‍රිතව හමු වේ. බූන්දල ජාතික වනෝද්‍යානය විශාල වශයෙන් ශාක විශේෂ රැසකට ද නිජබිම වී තිබේ. ඒ අතර විරල ගනයේ ඖෂධ පැළෑටි කිහිපයක් ද උදා.(kedrostis foetida) වාර්තා වී තිබේ.



වනෝද්‍යානය වියළි බිම් පෙදෙසේ ස්වාභාවික වනාන්තරය කටු පඳුරු හා තෘණතලා වලින් ද සමන්විත වන අතර එහි සංචාරකයන් සඳහා කඳවුරු භූමි දෙකක් ද වේ.

ජලජ පක්ෂීන්ට නිවහන සලසන බූන්දල ජාතික වනෝද්‍යානයේ පිහිටි නොගැඹුරු ජලාශ පහ සහ කළුදිය කලපු ද විශේෂ ආකර්ෂණය වේ.

වනෝද්‍යානය තුළ පිහිටුවා ඇති ප්‍රදර්ශනාගාරයකින් හා ශ්‍රවනාගාරයකින් සැදුම් ලත් සංචාරක තොරතුරු මධ්‍යස්ථානය මගින් ද සංචාරකයන්ට අවශ්‍ය තොරතුරු ලබා ගත හැකි බව අවසාන වශයෙන් සඳහන් කළ යුතු ය.